1.2 පරිගණක සංරචක හඳුනාගනිමු

පරිගණකයක් සෑදී ඇත්තේ කොටස් ගණනාවක එකතුවකිනි. එම කොටස් සංරචක කිහිපයකට බෙදා දැක්විය හැක.

පරිගණක සංරචක

- ආදාන උපක්‍රම → පරිගණකය තුලට දත්ත හා උපදෙස් ඇතළත් කරයි.
- ප්‍රතිදාන උපක්‍රම → පරිගණකය තුල සකස් කළ තොරතුරු පිටතට ලබා දේ.
- ආචයන උපක්‍රම → නැවත භාවිතය සඳහා දත්තහාඋපදෙස් ගබඩාකොට තබාගනී.
- සන්නිවේදන උපක්‍රම → පරිගණකයක ඇති තොරතුරු හුවමාරුව සඳහා අවශ්‍ය වේ.
- ප්‍රධාන මතකය → පරිගණකයක දත්ත හා උපදෙස් තාවකාලිකව රඳවා තබාගනී.
- මධ්‍යම සැකසුම් ඒකකය → පරිගණකය මෙහෙයවීම සිදු කරයි.

පහත දක්වා ඇති උපාංග ඇසුරින්,ලබා දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

මූසිකය	මොඩමය	පෑන් ධාවකය	දෘඪ තැටිය
සසම්භාවී ප්‍රවේශ මතකය	යතුරු පුවරුව	මයික්‍රෆෝනය	රවුටරය
මධ්‍ය සැකසුම් ඒකකය	සන්දර්ශකය	මුද්‍රණ යන්ත්‍රය	වෙබ් කැමරාව
ආලෝක පෑන	තීරු කේත කියවනය	ශබ්ද විකාශන යන්ත්‍ර	
ස්කෑනරය	වීඩියෝ තැටිය	සංගත තැටිය	

ආදාන උපක්‍රම	ප්‍රතිදාන උපක්‍රම	සන්නිවේදන උපක්‍රම	ආචයන උපක්‍රම	මධ්‍යම සැකසුම් ඒකකය	ප්‍රධාන මතකය
උදා - මූසිකය					